# වාචාල පටිපන්නෝ

මට කටට ආපු මාතෘකාව කාණු පටිපන්නෝ ය. එය ටිකක් සුද්ද කරලා ඉදිරිපත් කළ යුතු බව පසුව තීරණය කළෙමි.

ඔබ ජාතක කතාවක් කියවලා නැත්නම් අහලාවත් ඇති. ජාතක කතාවට කොටස් තුනක් ඇත. අතීත කතාව. වර්තමාන කතාව සහ ප්‍රතිසන්ධි ගැලපීමය. මුලට එන්නේ වර්තමාන කතාවය. බුදු හාමුදුරුවන්ට පරණ කතන්දරය කියන්නට හේතු වූ සිද්දිය වර්තමාන කතාවට ඇතුළත්ය. අතීත ජන්මයක සිදුවූ සිදුවීම්



මාලාව - අතීත කතාව - කියා වදාරන්නේ වත්මන් පුවතින් මතු වූ කිසියම් ලක්ෂණයක් පෙන්වා දෙනු පිණිසය.

ඔබ වෙහෙස කරන විදියේ පෙරවදනක් ලිවිය යුතු වූයේ මගේ සිරස් තලයට පසුබිම දක්වනු පිණිසය. පසුබිමේ සිදුවීම් වල කෙටි නාටක දෙකක් - හරියටම නාටක එකක් හා දෙබිඩි රංගනයක් ඇත .

හැටේ දශකයේ ශ්‍රී ලංකා මැතිවරණයකට පෙර දවස පත්තරයේ පුවත්පත් කලාවේදීන් පිරිසක් සමග ඡායාරූප ශිල්පී නිමල් පිටිපන ද ඉල්ලා අස්විය. ඒ පිරිසට අයත් වූවන් අතර අර්වින් වීරක්කොඩි ද විය. නිමල් සමග තව කෙනෙක් දෙන්නෙක් ඇත්ත පත්තරයට එක් වූහ. නිමල් ළඟ "දවසෙන්" නිකුත් කරන ලද හැඳුනුම්පත සුරැකිව තිබිණ. එය ආපසු ගන්නට මත්තෙන් පලක් ගන්නට සිතූ නිමල් තකහනියක් මාලේවන රසායනාගාරයට ගොඩ වූයේ හාමුදුරුවන්ගේ පින්තූර ටිකක් අරගන්නටය.

"ස්වාමීන් වහන්ස.. අපේ පත්තරය තීරණය කළා ඔබ වහන්සේ ගැන විස්තර සහිත ලිපියක් පළ කරන්න. ඒකට දාන්න පින්තූර ටිකක් ගන්න අවසර දෙනවද?"

පත්තරේ පින්තූර් දා ගන්න අකැමැති හාමුදුරුනමත් පින්බිම කොහොම වුණත් සිරි ලංකාවේ ඇතැයි නොසිතමි. (භාවනා මධ්‍යස්ථානයක සිටිය හැකිය) මාලේවන ඤාණිස්සර හාමුදුරුවෝ ප්‍රීතියෙන් පිනාගිය සේක. නිමල්ට උවමනා හැම ඉරියව්වකින්ම පින්තූර ගණනාවක් ගැනීම ප්‍රශ්නයක් නොවීය. ආපු රාජකාරිය සාර්ථකව ඉටුකරගත් නිමල් රසායනාගාරයෙන් පිටවන මොහොතේ හාමුදරුවන්ට දුරකතන ඇමතුමක්.

"ස්වාමීන්වහන්ස නිමල් පිටිපන දැන් අස්වෙලා. මිනිහට රැවටෙන්න එපා"

ඔත්තුකාරයා පමාවුණා වැඩිය. නිමල් පාරට බැහැලාය.

එදා ගත්තු ඡායාරූප පසු දිනම ඇත්ත පත්තරයේ පිටුවක් පුරා පළවිය. විස්තර කියා කිසිවක් නැත . සිරස්තලය

"රබර් පටිපන්නෝ"

එකත් එකට සිරාගේ (බී ඒ සිරිවර්ධන) වැඩක්. එය දුටුවකුට අමතක නොවන දර්ශනයකි.

ඒ නාටකයේ නළුවා හාමුදුරුවන් ය. නිෂ්පාදක නිමල් පිටිපන ය. අධ්‍යක්ෂ නොහොත් නූල් සූත්තරකාරයා සිරස්තලය ලියූ සිරා ය. අගමැති ප්‍රේමදාස විසින්ද පසසනු ලැබූ පත්තරක-ාරයෙක්.

දෙවැනි නාටකයේ නිෂ්පාදක අධ්‍යක්ෂ දෙකම එක්කෙනෙක්ය. ජනාධිපති ප්‍රේමදාස. නළුවන් දෙදෙනකු වත් ඇති බව කියැවුණ ද ඔවුන් අද දක්වා වේදිකාවට ආවේ නැත. වේදිකාවට ගෙන එන හස්තිකාන්ත මන්තරේ ඇත්තේ ආර්




ප්‍රේමදාස ළඟය. දරුවකුට දුන් බවක් සඳහන් නොවෙයි. කරලියට නොගත් හෙයින් හරියටම ඔවුන් නම් කිරීම හරි නැත. බැරි වෙලාවත් මන්තරය අසා එක ඇතකුවත් රඟමඬලට ඇවිත් විශේෂ රුදාවකින් පෙනී සිටිනු නියතය. විපුල ධර්මවර්ධන විසින් නිර්මාණය කරනු ලබන බතික් කංචුකය නිසා නොව කසාවත් පිළීයෙන් සැරසී එන්නට ඉඩ තිබුණෝය.

මට ඔය අතීත කතාව මතක් වූයේ පසුගිය දින දෙකක්ම ශ්‍රී ලංකාවේ පත්තරයක පළවූ පුවතක් කියවූ විටය.

"ජනාධිපතිනියගේ මුල් පෙම්වතා ගැන කිසි කෙනෙක් නොදන්නා කතාවක් මට කියවිලා" වචන ඔය වාගේය. ඔය වාගේ අඬහැර කියන කෙනෙක් අපේ ගමේ සිටියේය. කටහඬ ඇසුණ විගස ගැමියෝ ඔහු හඳුනාගනිති.

මේ අඬහැරය සුප්‍රකට භික්ෂුවකගේය. ඇල්ලේ ගුණවංශ. මට රාත්තිරියට කියන තුන් සූතුර මතක් විය. මංගල සූත්‍රයේ කොටස්. එකක් සන්තින්ද්‍රියෝච සිපකෝච. සන්සුන් ඉඳුරන් ඇතිකම සහ උගත්කම. සිපකෝ යන්න මගේ ලංසුවට අනුව පොත පතේ දැනුම නොවේ. ඇසූ පිරූ තැන් ඇති බවය. අකුරු නොදත් ගැමියා වෙත පවා මෙම සිපකෝ ගුණය ඇත.

බන්තී ච සොවචස්සතා

මගේ මනසට එන අනෙක් උදෘතය එයයි. එතැනත් මම පොතේ එන අර්ථ කථනය ඉක්මවා යමි. සෝවාචස්ස යනු අවවාදයට ගරුකරන නොහොත් කියන එක අහන යන්නය. මගේ නිර්වචනය ඊට වඩා මදක් වෙනස්ය. සුවච යන්නට මම කීකරුකමට තවත් ටිකක් එකතු කරන්නෙමි. "සු" යන්න පිරිසිදු - යහපත් යන්නය. සුවච යන්නෙන් යහපත් වචන භාවිතා කරන යන අර්ථයද දෙනු ලැබේ. "කට කැඩිච්ච කතා නොකියන" යන අර්ථයද මම එකතු කරමි.

ප්‍රේමදාස මහතා පමණක් පාඩම්කරගෙන හිටපු මන්තරය තිබුණා නම් - මැතිරුවා නම් - කට කැඩිච්ච කතා අසන්නට නොලැබෙන බවද කියන්නෝද සිටිති.

මා උපුටා දැක්වූ ගුණාංග නොහොත් මංගල කාරණා පැවිද්දන් සඳහා නොව අප වැනි ගිහියන් වෙනුවෙන් දේශණා කරන ලද මංගල සූත්‍රයේ එන කරුණු සහ දෙව්රම් වෙහෙරට මහ රෑ අනුත් බුදුන්ගෙන් දෙවියකු ඇසූ ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් දේශනා කරන ලද බව සූත්‍රයේම දැක්වෙයි.

"යහපත් කොට යතැයි
සුන්දර තැනට සැපතැයි
සොඳුරු බස් කියතැයි
කියති ඒ මුණි රජුට සුගතැයි"

බුදුගුණාලංකාරයේ ඒ කියන්නේ නම් සම්මා සම්බුදු රජාණන්ටය. උන් වහන්සේ විසින් පිහි-ටුවන ලද සංඝ ශාසනය ද සුපේශල ශික්ෂාකාමී ගෝලයන්ගෙන් සමන්විත වූවක් යයි කියනු ලැබේ.

සිරා ලියූ රබර් පටි පන්නෝ නම්බුනාමය නම් දිගට හරහට පිරිනැමියහැකි එකකි. එය මංගල සූත්‍රයේ කියන ගුණාංග සමග ගැටෙන්නේද නැත . මා විසින් යෝජනා කරන ලද සිරස්තලය වනාහි සුවිශේෂ කුසලතා සහිත ප්‍රායෝගික අත්දැකීම්ද සහිත සුලු පිරිසකට තෝරා බේරා දිය යුතු "ගෞරවයකි"

**MONT ALBERT DENTISTS P/L**

For all Your Dental Requirements

We Provide

GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES

WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.

FOR APPOINTMENTS
9890 3609

DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS

DR. ENOKA JAYATILAKEBANDA (BDS)

MONT ALBERT DENTISTS

2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)

www.montalbertdentists.com.au

**αlpha academy**

Primary, Secondary ,VCE

2014 **Program - Enrollments open**

Primary & Secondary - Mathematics, Science and English
VCE - Biology, Chemistry
VCE English - Recommended Texts, Analytical Writing

Classes conducted by Current School Teachers

**Contact - Sarah on 0457908918**
ABN 52267352093